දේශපාලන විද්‍යාව - 12 ශ්‍රේණිය

**නිපුණතාවය 8 - නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 8.3 - එම ආණ්ඩුක්‍රමවල ප්‍රවණතා හා ගැටළු පෙන්වා දෙයි.**

**පහත සඳහන් බහුවරණ ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුරු තෝරන්න.**

1. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ විධායකය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

   A. කැබිනට් ක්‍රමයකට වඩා මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක පවතින විධායකයට සමාන වේ.
   B. අගමැතිවරයා විධායකයේ නායකයා වේ.
   C. ස්ථිර විධායකය නාමික හා සත්‍ය විධායකය යටතට පත් කර ඇත.
   D. ස්ථිර විධායකය ස්වාධීන කිරීම හා සුළු ජාතීන්ටද රැකවරණ සැපයීය.
   E. ආණ්ඩුවේ නායකත්වය අග්‍රාණ්ඩුකාර ධූරය වෙත ලබා දී තිබුණි.

2. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අග්‍රාණ්ඩුකාරවරයා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

   A. බ්‍රිතාන්‍ය කිරීටයේ නියෝජිතයා වන්නේය.
   B. තම කාර්යයන් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය කිරීටයට වගකිව යුතු වන්නේය.
   C. සෑම කාර්යයක් සම්බන්ධයෙන්ම අගමැතිගේ උපදෙස් මත ප්‍රායෝගිකව කටයුතු කළේය.
   D. ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමේදී පක්ෂපාතී වූ බවට චෝදනා එල්ලවිය.
   E. රාජ්‍ය නායකයා හා විධායකයේ නායකත්වය භුක්ති වින්දේය.

3. පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ අගමැතිවරයා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

LIVEWORKSHEETS

A. ජනාධිපතිවරයා පත් කිරීමේ කාර්යය පැවරුණි.
B. හදිසි තත්ව පැනවිය යුතු අවස්ථා තීරණය කරන ලදී.
C. ජාතික රාජ්‍ය සභාවේ බහුතරයේ සහාය මත කටයුතු කරන ලදී.
D. කැබිනට් මණ්ඩලය තේරීමටත් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය මෙහෙයවීමටත් බලය ලැබුණි.
E. ජාතික රාජ්‍ය මගින් සම්මත කරන ලද දෝෂාභියෝගයකින් ඉවත්කළ හැකි විය.

4. පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A. අගමැති විසින් වසර 4ක් සඳහා පත් කරන ලදී.
B. නිල කාලය අවසන් වූ පසු ධූරය සඳහා යළි පත් කළ නොහැක.
C. අගමැතිවරයාගේ උපදෙස් මත ස්වකීය කාර්යයන් ඉටු කරනු ලබයි.
D. අගමැති විසින් ඉදිරිපත් කරන ලද විශ්වාසභංගයක් ජාතික රාජ්‍ය සභාවේ සම්මත කිරීමෙන් ධූරය අහෝසි වේ.
E. සෝල්බරි අග්‍රාණ්ඩුකාරවරයාට වඩා බලයෙන් හා තත්වයෙන් අඩු මට්ටමක සිටියේය.

5. පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A. අගමැතිගේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරයි.
B. පවරා ඇති කාර්යයන් වෙනස්කම්වලට යටත්ව සිදු විය.
C. ජනාධිපතිගේ අත්සනින් යවන ලිපියක් මගින් ඉවත් කළ හැක.
D. විශ්වාසභංගවලට යටත් වේ.
E. ජාතික රාජ්‍ය සභාව විසුරුවීමෙන් ධූරය අහෝසි වේ.

LIVEWORKSHEETS

6. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් අදාළ ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A. දේශපාලනීකරණය කරමින් එහි ස්වාධීනත්වය බිඳ දැමුවේය.
B. ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් හරහා පහළ රාජ්‍ය සේවය පාලනය කළේය.
C. ඉහළ රාජ්‍ය සේවකයින් පත් කිරීම අග්‍රාණ්ඩුකාරවරයාගේ වගකීමක් බවට පත් කළේය.
D. අනවශ්‍ය ස්වාධීනත්වයෙන් දේශපාලන විධායකය සමඟ ගැටුම් ඇති කළේය.
E. රාජ්‍ය සේවා කොමිසමේ බලය යටත් කොමිසම්වලට පැවරිය හැකි විය.

7. 1972 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A. ස්වාධීනත්වයට විවිධ බාධා එල්ල විය.
B. අමාත්‍ය මණ්ඩලයේ පාලනයට යටත්ව කටයුතු කළේය.
C. ජනාධිපතිවරයා විසින් පත් කරන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක හා විනය මණ්ඩලයකින් සමන්විත විය.
D. රාජ්‍ය සේවයේ ඉහළ පත් කිරීම් සඳහා ඇමති මණ්ඩලයට උපදෙස් දීමට උපදේශක මණ්ඩලයක් පත් කළේය.
E. රාජ්‍ය සේවය පාලනය සම්බන්ධයෙන් උපදේශක හා විනය මණ්ඩලය ජාතික රාජ්‍ය සභාවට වගකීමට බැඳී සිටියේය.

LIVEWORKSHEETS